වාර්ෂික පර්යේෂණ සැසිය 2022
සිංහල අධ්‍යයනාංශය - කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය අංශය විසින් වාර්ෂික ව සංවිධාන කරනු ලබන පර්යේෂණ සැසිය සැප්තැම්බර් මස 22 වන දා බ්‍රහස්පතින්දා හා සැප්තැම්බර් 23 වන දා සිකුරාදා පැවැත්වේ. මෙවර පර්යේෂණ සැසියෙහි තේමාව සිංහල භාෂා විෂයක විචාර සංකථන වන අතර ඒ යටතේ සිංහල භාෂාව සහ වාග්විද්‍යාව, සම්භාව්‍ය සහ නූතන සාහිත්‍යය, සිංහල සංස්කෘතිය සහ කලා ශිල්ප, සාහිත්‍ය නිර්මාණකරණය හා විචාරය යන උපශික්ෂණ යටතේ ස්වකීය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට පර්යේෂකයන්ට අවස්ථාව ලබා දී ඇත. පර්යේෂණ සැසියෙහි සමාරම්භක උත්සවය සැප්තැම්බර් 22 වන දා බ්‍රහස්පතින්දා උදෑසන කොළඹ විශ්වවිද්‍යාලයේ නව කලාගාරයේ දී උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. මුඛ්‍ය දේශනය සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය සරත් විජේසූරිය විසින් පැවැත්වේ. මෙවර සැසියෙහි විශේෂත්වය වන්නේ පර්යේෂකයන්ට මාර්ගගතව (online) ද ස්වකීය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා තිබීම යි. පර්යේෂණ සැසියෙහි සමෝධාන සැසිය වෙන් කර තිබෙන්නේ, කොළඹ විශ්වවිද්‍යාලයෙන් බිහි වූ විශිෂ්ට විද්වතෙකු වන සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායකයන් විසින් සිංහල භාෂාව, සාහිත්‍යය, සංස්කෘතිය හා කලාශිල්ප විෂයෙහි ඥාන සම්පාදනයෙහිලා සිදු කරන ලද ශාස්ත්‍රීය මෙහෙවර ඇගයීමට ලක් කිරීම වෙනුවෙනි. සිංහල අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමි කෝපරහේවා විසින් මුලසුන දරනු ලබන මෙම සැසියේ දී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස් හා රාජ්‍ය සම්මානලාභී ලේඛිකා තනුජා එන්. අයගම අදහස් දැක්වීමට නියමිත ය. පර්යේෂණ සැසියට සමගාමී ව කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨ පරිශ්‍රයේ පොත් ප්‍රදර්ශනයක් ද පැවැත්වේ.